## සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ නර්තන හා නාට්‍ය කලා පීඨයට නවක විද්‍යාර්ථීන් බඳවා ගැනීමේ අභියෝග්‍යතා පරීක්ෂණය

උක්ත පරීක්ෂණයේ දී අපේක්ෂක අපේක්ෂිකාවන්ට ලකුණු ලැබෙනු ඇත්තේ පරීක්ෂණ මණ්ඩල 03 කින් ලබාදෙනු ලබන ලකුණුවල එකතුවක් හැටියටය. එක් එක් මණ්ඩලයේ පරීක්ෂකවරුන් විසින් තනි තනිව සිය ස්වාධීන ලකුණු ලැයිස්තුව බැගින් ලබාදිය යුතුය. විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර ආචාර්යවරුන්ගෙන් මෙන්ම බාහිර විෂය ප්‍රවීණයන්ගෙන් ද පරීක්ෂණ මණ්ඩල සමන්විත වේ. පරීක්ෂණ මණ්ඩලය සාමූහිකව සංවාදකොට ලකුණු ලබාදීම සපුරා තහනම් වේ. එසේ තනි තනිව ලකුණු ලබාදෙන පරීක්ෂකවරුන්ගේ සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩිය. විනිවිදභාවය සහතික කිරීම, බලපෑම් කිරීමට ඇති අවකාශය ඉවත් කිරීම හා අපේක්ෂක අපේක්ෂිකාවන්ට ඉහළම සාධාරණයක් ඉෂ්ට කිරීම පිණිස මෙම ක්‍රමවේදය විශ්වවිද්‍යාලය විසින් අනුගමනය කරනු ලැබේ.

### 01. පළමු පරීක්ෂණය - 50%

ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායයන් හා තදනුබද්ධ වාදන විධි පිළිබඳ ප්‍රායෝගික දැනුම මෙහිදී පරීක්ෂාවට ලක් කෙරේ. නියම කරනු ලබන කාල වේලාව තුළ පරීක්ෂණ මණ්ඩලය ඉදිරියේ ශීර්ෂ 03 ක් යටතේ අපේක්ෂකයා විසින් ඉදිරිපත් කිරීම් සිදුකළ යුතු වේ. (උපරිම කාලය මිනිත්තු 20)

| | | **ලකුණු** | **කාලය** |
|---|---|---|---|
| I. | උඩරට, පහතරට, සබරගමු නර්තන සම්ප්‍රදායයන්ගෙන් එක් සම්ප්‍රදායකට අයත් නර්තනයක් ගායනය සමග | 30 | මිනිත්තු 05 |
| II. | අංක 01 හිදී ඉදිරිපත් කරන ලද සම්ප්‍රදාය හැර අනෙක් සම්ප්‍රදායයන් දෙකෙන් එක් සම්ප්‍රදායට අයත් නර්තනයක් | 10 | මිනිත්තු 05 |
| III. | සිංහල නර්තන සම්ප්‍රදාය හා බැඳි අවනද්ධ වාද්‍ය භාණ්ඩ අතුරින් එකක් හෝ දෙකක් වාදනය කිරීම | 10 | මිනිත්තු 05 |
| | **ලකුණු එකතුව** | 50 | |

### 02. දෙවන පරීක්ෂණය - 40%

| | | **ලකුණු** | **කාලය** |
|---|---|---|---|
| I. | විදේශීය නර්තනාංගයක් | 10 | මිනිත්තු 05 |
| II. | පරීක්ෂක මණ්ඩලය විසින් ලබාදෙනු ලබන සංගීත ඛණ්ඩයකට අනුව නර්තනයක් - එසැණ නිරූපණ නර්තනයක් (Improvisation) (සංගීත ඛණ්ඩ 10කින් අහඹු ලෙස 01ක් තෝරා ගත හැකිය) | 10 | මිනිත්තු 05 |
| III. | පරීක්ෂක මණ්ඩලය විසින් සපයනු ලබන කෙටි සිනමා/වීඩියෝ දර්ශනයක /ඡායාරූපයක් පිළිබඳ විචාරාත්මක අදහස් දැක්වීම | 10 | මිනිත්තු 05 |
| IV. | අපේක්ෂකයාගේ අභිලාෂය පිළිබඳ ප්‍රකාශනය (personal ststement) සමාජ සහ සමාජ දේශපාලනික දැනුම | 10 | මිනිත්තු 05 |
| | **ලකුණු එකතුව** | 40 | |

03. තෙවන පරීක්ෂණය (සහතිකපත්‍ර පරීක්ෂාව) - 10%

කැඳවනු ලබන අපේක්ෂකයා / අපේක්ෂිකාව විසින් ඔවුන්ගේ කුසලතා ප්‍රදර්ශනය කිරීම සඳහා ඔවුන් විසින් දිනා ඇති විවිධ සහතික, පදක්කම්, සම්මාන හා ප්‍රසංග සඳහා ලැබී ඇති ප්‍රශංසාත්මක ලිපි සමග තමන් සහභාගි වී ඇති නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල (නාට්‍ය නිෂ්පාදන, නර්තන ප්‍රසංග ආදී) ඡායාරූප 10 කින් යුත් ගොනුවක් (Portfolio) සම්මුඛ පරීක්ෂණය සඳහා රැගෙන යා යුතුය.

දේශීය මට්ටමේ හැකියාවන් සඳහා ප්‍රථම ස්ථානයකට එක් ලකුණක් ද ඉතිරි ස්ථාන සඳහා දශමස්ථානවලින් ලකුණු එකතු වන ආකාරයට ද ජාත්‍යයන්තර මට්ටමේ දිනා ඇති පදක්කම් හෝ සහතික පත් සඳහා ප්‍රථම ස්ථානයකට ලකුණු 02ක් ද වශයෙන් අනෙකුත් ස්ථාන සඳහා දශමස්ථානවලින් ලකුණු වන ආකාරයට උපරිම ලකුණු 10ක් තෙවන පරීක්ෂණයේදී ප්‍රදානය කෙරේ.

උදාහරණ ලෙස, ලකුණු ලබා දීම සඳහා සලකා බලන ඉසව් පහත දක්වා ඇත.

**ජාතික තලය**

- ජාතික නැටුම් පිළිබඳ විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව අවසාන සහතික පත්‍රය
- රජයේ පිළිගත් අධ්‍යාපන අමාත්‍යාංශය, සංස්කෘතික අමාත්‍යාංශය හෝ ජාතික තරුණ සේවා සභාව වැනි ආයතන මගින් පවත්වනු ලබන වසරකට නොඅඩු නර්තන, ජනමාධ්‍ය, ජන සන්නිවේදන පාඨමාලා සඳහා

**ඒක පුද්ගල ඉදිරිපත්කිරීම**

ප්‍රථම ස්ථානය, දෙවන ස්ථානය, තෙවන ස්ථානය

**කණ්ඩායම් ලෙස ඉදිරිපත් කිරීම**

ප්‍රථම ස්ථානය, දෙවන ස්ථානය, තෙවන ස්ථානය

**ජාත්‍යන්තර තලය**

**ඒක පුද්ගල ඉදිරිපත් කිරීම**

රන් පදක්කම / ප්‍රථම ස්ථානය, රිදී පදක්කම / දෙවන ස්ථානය, ලෝකඩ පදක්කම/ තෙවන ස්ථානය, සහභාගිත්වය

**කණ්ඩායම් මට්ටමින් ඉදිරිපත් කිරීම**

රන් පදක්කම / ප්‍රථම ස්ථානය, රිදී පදක්කම / දෙවන ස්ථානය, ලෝකඩ පදක්කම/ තෙවන ස්ථානය, සහභාගිත්වය

කුසලතා ඇගයීමේදී අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිටි වර්ෂයට පෙර වර්ෂ 03 කට අදාලව සහ අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිටි වර්ෂයට පසු වර්ෂයකට අදාළ කුසලතා සහතික පමණක් සළකා බලනු ලැබේ.

**පීඨාධිපති**

**නර්තන හා නාට්‍ය කලා පීඨය**